ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

<u>භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම</u>

2026 ඔක්තෝබර් 14 වැනි දින රුපියල් මිලියන 90,000 ක් වටිනා
භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේ වෙන්දේසිය

භාණ්ඩාගාර බිල්පත් නිකුතුව පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

පරිණත කාලය	**දින 91**	**දින 182**	**දින 364**	එකතුව
සු.හ.ජා. අංකය (ISIN)*	LKA09127A158	LKA18227D167	LKA36427J150	
වෙන්දේසිය සඳහා ඉදිරිපත් කළ මුදල (රු.මිලි.)	40,000	30,000	20,000	90,000

වෙන්දේසි කරන දිනය	: 2026 ඔක්තෝබර් 14 වැනි දින
ගෙවීම් කළ යුතු දිනය	: 2026 ඔක්තෝබර් 16 වැනි දින
නිකුතුවේ දිනය	: 2026 ඔක්තෝබර් 16 වැනි දින
ලංසු භාරගන්නා අවසාන දිනය හා වේලාව	: 2026 ඔක්තෝබර් 14 වැනි බදාදා පෙ.ව. 11.00
ලංසුවක් සඳහා අවම මුදල	: රුපියල් මිලියන පහක් (රු. 5,000,000/-) සහ ඉන් අනතුරුව රුපියල් මිලියනයේ (රු. 1,000,000/-) ගුණිතයන්ගෙනි.

රජයේ සුරැකුම්පත් පිළිබඳ ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ. ලංසු ඉදිරිපත් කළ යුත්තේ සපයනු ලැබ ඇති විද්‍යුත් ලංසු ඉදිරිපත් කිරීමේ පහසුකම මගින් පමණකි. ඉහත සඳහන් පරිදි ලංසුවක් සඳහා වන අවම මුදලට අනුගත වෙමින් අපේක්ෂිත ආයෝජකයන්ට (මහජනතාව හෝ වෙනත් ඕනෑම ආයෝජකයෙකුට) පහත සඳහන් ප්‍රාථමික අලෙවිකරුවන් හරහා ලංසු ඉදිරිපත් කළ හැකිය.

ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ලැයිස්තුව

ලංකා බැංකුව	2541938	ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් පී.එල්.සී.	2639883
කැපිටල් එලයන්ස් පී.එල්.සී.	2317777	මහජන බැංකුව	2206783
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.	2332319	සම්පත් බැන්ක් පී.එල්.සී.	2305842
එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්	2425010	සෙලාන් බැන්ක් පී.එල්.සී.	2456340
එච්.එන්.බී සෙකියුරිටීස් ලිමිටඩ්	2206297	වෙල්ත්ට්‍රස්ට් සෙකියුරිටීස් පී.එල්.සී.	2675096

වෙළෙඳපොළ තත්ත්වයන් මත, මෙම වෙන්දේසියට ඉදිරිපත් කරන ලද සම්පූර්ණ ප්‍රමාණය ඉක්මවා නොයන පරිදි, එක් එක් පරිණත කාලයන්ට අදාළව ඉදිරිපත් කරන ලද ප්‍රමාණයන්ට වඩා අඩු හෝ වැඩි ප්‍රමාණයන් රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් පිළිගනු ලැබිය හැකි ය.

අපේක්ෂිත ආයෝජකයන්ට ප්‍රාථමික අලෙවිකරුවන් හෝ අනෙකුත් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හරහා ද්විතියික වෙළඳ පොළෙන්ද භාණ්ඩාගාර බිල්පත් මිලදී ගත හැකිය.

* සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංකය

<u>**නිකුත් කරන කාර්යාලය**</u>
රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
ලේකම් කාර්යාලය, කොළඹ 1.
දුරකථන : +94 112 484 604
www.treasury.gov.lk

උදේනි උඩුගහපත්තුව
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය